# 14. අන් අයට උදවු කිරීම

අන් අයට උදවු කිරීම යහපත් ගුණ ධර්මයකි. සමහර විට එය වගකීමක් ද වේ. පහත සඳහන් සිද්ධිය මෙයට හොඳ උදාහරණයකි.

හසරත් උමර් රළියල්ලාහු අන්හු තුමා දෙවන කලීෆාවරයා ය. එතුමා මදීනාවේ සිට රට පාලනය කළේ ය. රාත්‍රී කාලයේ ගම් වටා ඇවිදීම එතුමාගේ සිරිතකි. දවසක් එතුමා වෙස් මාරු කර ගෙන ගමක් වටා ගියේ ය. එතුමා කලීෆා බව කිසිවකුටවත් දැන ගත නොහැකි විය. ඒ අවස්ථාවේ එතුමාට දරුවන් හඬනවා ඇසුණි. ඔහු ඒ හඬ ආ පැල්පතට ළං වී බැලුවේ ය.



ගැහැනියක් ළිප මොලවමින් සිටියා ය. ඇය වටා දරුවෝ අඬමින් සිටියෝ ය. ළිපෙහි තිබූ වළඳේ දිය පමණක් තිබුණි. එය පෙන්වා කෑම පිළියෙල කරන බව කියමින් ඇය දරුවන් රවටමින් සිටියා ය.

කලීෆා මෙය තේරුම් ගත්තේ ය. ඒ විගස ම මදීනාවට ගොස්, ආහාර ද්‍රව්‍ය පොදි බැඳ, තම උරහිසෙහි තබා ගෙන පැමිණියේ ය. ඒවා එම ගැහැනියට දුන්නේ ය. කාන්තාව විසින් පිසින ලද ආහාර කෑ දරුවෝ සතුටු වූහ. කුස ගිනි නිවා ගත් දරුවෝ සිනාසෙමින් සෙල්ලම් කළහ.

පසු දින මදීනාවට පැමිණ කලීෆාවරයා හමුවන ලෙස එම කාන්තාවට පවසා, එතුමා එතැනින් පිටත් ව ගියේ ය.

මෙලෙස අපි ද අන් අයට උදවු කරමින් ජීවත් වීමට පුරුදු වෙමු.

## පැවරුම්

**කෙටි පිළිතුරු අභ්‍යාස පොතේ ලියන්න.**

1. දෙවන කලීෆාවරයාගේ නම කුමක් ද?
2. කලීෆාවරයා ගම වටා ඇවිද ගියේ කුමන වේලාවේ ද?
3. දරුවන් හැඬීමට හේතුව කුමක් ද?
4. කලීෆාවරයා ගෙන ආ බඩු මොනවා ද?
5. කුසගිනි නිවාගත් දරුවෝ කුමක් කළෝ ද?